විෂයය - බුද්ධ ධර්මය - 7 ශ්‍රේණිය

නිපුණතාව - ජීවී අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි.

නිපුණතා මට්ටම - මානව සබඳතා පවත්වා ගැනීමට ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතුව ක්‍රියා කරයි

පාඩම -18 පාඩම- තැනට ගැළපෙන ලෙසින් හැසිරෙමු.

# 18 - පාඩම

## තැනට ගැළපෙන ලෙසින් හැසිරෙමු.

1) හිස්තැන් පුරවන්න .
   1. බුදු දහම අනුව අප අනුන් හා පවත්වන කතා බස් දෙයාකාරය . එම ආකාර දෙක නම්

      _______________ හා ________________________ වේ .

   2. සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ "කියනවා" යන්න සඳහා ව්‍යවහාර වන ශාසනික වචනය

      වන්නේ __________________________

2) කෙටි පිළිතුරු සපයන්න .
   1. "සුභාෂණ" යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද ?
   2. මජ්ඣිම නිකායේ අභයරාජ සූත්‍රයට අනුව අප කතා කරන වචනවල ඇතුළත් විය යුතු ප්‍රධාන අංග තුන ලියන්න.
   3. භික්ෂූන් වහන්සේ නමක් ආමන්ත්‍රණය කිරීම සඳහා භාවිත කළ හැකි ගෞරවාන්විත ආමන්ත්‍රණ ලියන්න

3) නිවැරදි ලෙස ශාසනික වචනය ගළපන්න .

| අදහස | ශාසනික ව්‍යවහාරය |
|---|---|
| 1. නිදාගන්නවා | වැඩ සිටිනවා |
| 2. අනුභව කරනවා | සිව්රු පොරවනවා |
| 3. කියනවා | අමදිනවා |
| 4. ඇවිදිනවා | දේශනා කරනවා |
| 5. සිටිනවා | සක්මන් කරනවා |
| 6. තේ බොනවා | සැතපෙනවා |
| 7. ඇඳුම් අඳිනවා | වළඳනවා |
| 8. අතු ගානවා | ගිලන්පස වළඳනවා |

4) කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න

තම නිවසට පැමිණි

සැම දෙන හට කුලුණෙනි

......................................................

.....................................................

5) ඔබගේ නිවසට පැමිණෙන නෑදෑ හිත මිතුරන්ට ප්‍රිය වචනයෙන් සංග්‍රහ කරන්නේ කෙසේ ද?

6) යහපත් වචන කතා කිරීමෙන් අපට සැලසෙන වාසි දක්වන්න .(යහපත් ප්‍රතිපල )

7) යහපත් වචන භාවිතයේ අගය දැක්වෙන වාක්‍ය පහක් සකස් කරන්න .



සැකසුම - ලලිත් වීරසිංහ
ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය - පිළියන්දල

## පළතුරු - 1 - කොටස

1)
1. සුභාෂණ , දුර්භාෂණ
2. දේශනා කරනවා

2)
1. බොරු කීමෙන් වැළකීම , ඇත්ත කීම ,ඇත්තෙන් ඇත්ත ගළපා කීම , තහවුරු කළ හැකි කතා බහ, පිළිගත හැකි වචන භාවිතය , අනුන් නොරැවටීම,
2. කතා කරන කරුණු සත්‍ය විය යුතුය
   හේතු සාධක සහිත විය යුතුය.
   අසන්නාගේත්, කියන්නාගේත් යහපත පිණිස හේතු විය යුතුය .
3. ස්වාමීන් වහන්ස , හාමුදුරුවනේ , අපේ හාමුදුරුවනේ , හාමුදුරුවන් වහන්ස ( මින් දෙකක්

3)

| | |
|---|---|
| 1. නිදාගන්නවා | වැඩ සිටිනවා |
| 2. අනුභව කරනවා | සිවුරු පොරවනවා |
| 3. කියනවා | අමදිනවා |
| 4. ඇවිදිනවා | දේශනා කරනවා |
| 5. සිටිනවා | සක්මන් කරනවා |
| 6. තේ බොනවා | සැතපෙනවා |
| 7. ඇඳුම් අඳිනවා | වළඳනවා |
| 8. අතුගානවා | ගිලන්පස වළඳනවා |

4) කතා බස් කරමිනි
අසන් තොරතුරු සුදුසු විදියෙනි

5) ආයුබෝවන් කියා පිළිගැනීම ,තෙරුවන් සරණයි කියා ආශීර්වාද කිරීම, ආ ගිය තොරතුරු විමසීම, සතුටු සාමීචියේ යෙදීම.

6) අන් අයගේ ආදර ගෞරවයට පාත්‍රවීම . අන් අය අතර ප්‍රිය වීම . අන් අයගේ උදවු උපකාර ලැබීම . ආදී වශයෙන්

7) i. ප්‍රිය වචන කතා කරමු. (සුදුසු පරිදි මෙවන් ආදර්ශපාඨ)

ii. නපුරු වචන කථා නොකරමු

iii. කරුණාවෙන් කථා කරමු ආදී වශයෙන් වාක්‍ය 5 ක් ලියන්න.



**සැකසුම - ලලිත් වීරසිංහ**
**ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය - පිළියන්දල**